**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය**
**පුරප්පාඩු**

මෙම විශ්වවිද්‍යාලයේ සංගීත පීඨයේ මානවවංශ සංගීතවිද්‍යා අධ්‍යයනාංශයේ තාවකාලික පර්යේෂණ සහකාර තනතුර සඳහා සුදුසුසන් බඳවා ගැනීම සඳහා ප්‍රාසාංගික කලාවේදී උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර - තාවකාලික පර්යේෂණ සහකාර**

**මූලික සුදුසුකම්**

1. පිළිගත් විශ්වවිද්‍යාලයකින් පළමු පෙළ හෝ දෙවන පෙළ ඉහළ සාමාර්ථ සහිත උපාධියක් ලබා තිබීම.

**විශේෂ සුදුසුකම්**

(i) මානවවංශ සංගීතවිද්‍යා විෂය ක්ෂේත්‍රය පිළිබඳ පූර්ණ දැනුමක් ලබා තිබීම.
(ii) ක්ෂේත්‍ර අධ්‍යයනයට අදාළ ව ශාස්ත්‍රීය, තාක්ෂණික දැනුම හා පළපුරුද්ද ලබා තිබීම.
(iii) පර්යේෂණ හා සංරක්ෂණ කටයුතු පිළිබඳ ව තාක්ෂණික දැනුම ලබා තිබීම.

**වැටුප් පරිමාණය :-** U-AC-2 රු.85,305/- (මාසික) (නොගෙවනු ලබන දීමනාද ඇතුළත්ව) මීට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත වෙනත් දීමනා ද ගෙවනු ලැබේ

**අයදුම්කරුවන් සඳහා උපදෙස් :-**

1. අපේක්ෂකයින් විසින් සකස් කරන ලද ජීව දත්ත පත්‍රිකාවක් 2025.12.31 දින හෝ ඊට ප්‍රථම **"සහකාර ලේඛකාධිකාරී, සංගීත පීඨය, නො. 21, ඇල්බට් චන්ද්‍රවංකය, කොළඹ 07."** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ar_music@vpa.ac.lk දරණ ඊමේල් ලිපිනයට එවිය යුතු ය. ලියාපදිංචි තැපෑලෙන් එවනු ලබන අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර, විෂය සහ අධ්‍යයනාංශය පැහැදිළි ව සඳහන් කළ යුතු ය.

2. ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත් එවීමේ දී අයදුම්පත්‍රයෙහි සඳහන් කරුණු සනාථ කෙරෙන සේවා සහතික ඇතුළු අදාළ සියලු සහතිකපත්‍රවල සහතික කළ ඡායා පිටපත් අයදුම්පත සමග අමුණා එවිය යුතු අතර, ඊමේල් මගින් අයදුම් කිරීමේදී අදාළ සහතිකපත්‍රවල සහතික කළ ඡායා පිටපත් සමග ඊමේල් කළ යුතු වේ. අදාළ සහතික පත්‍ර පිටපත් අමුණා නොමැති අයදුම්පත් අසම්පූර්ණ ලෙස සැලකෙන අතර, ඇගයීමට භාජනය නොවෙනු ඇත.

3. රාජ්‍ය සේවයේ සහ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

4. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

5. ඉහත 1,2,3 කරුණු අසම්පූර්ණ, අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති සහ නියමිත දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේඛකාධිකාරී
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය